මගේ අංකය / எனது இல / My No: DSD/HO/02/Ad/01/Circular
ඔබේ අංකය / உமது இல / Your No: ..........................................
දිනය / திகதி / Date: 2022.02.15

**සමෘද්ධි දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 04/2022**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත අන්තර්ග්‍රහණය වන
සියළුම නිලධාරීන් වෙත.

**<u>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වන නිලධාරින් වෙත බලපා ඇති පරිපාලන ගැටළු විසඳීම.</u>**

ඉහත කරුණට අදාළව මගේ සමාංක හා 2021.07.14 දිනැති චක්‍රලේඛය හා බැඳේ.

02. එම චක්‍රලේඛයේ සඳහන් පරිදි සමෘද්ධි පනතේ 44 (ඉ) ii වගන්තිය යටතේ මුල් පත්වීමේ දින සිට විශ්‍රාම වැටුප් සහිතව දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වීමට මනාපය පල කළ නිලධාරීන් විසින් අධිකාරි සේවයට බැඳුණු මුල් දින සිට සේවක අර්ථ සාධක අරමුදලේ ගිණුම අවසන් කර ලබාගත් මුළු මුදලින් 60% ක් වූ රජයේ දායකත්වය ආපසු රජයට ගෙවිය යුතුව ඇත.

03. ඒ අනුව 2022.01.10 දින වෘත්තීය සමිති සමඟ අමාත්‍යාංශයේදී පැවති සාකච්ඡාවේදී වෘත්තීය සමිති විසින් කරන ලද ඉල්ලීම පරිදි ඉහත සඳහන් රජයට ගෙවිය යුතු දායක මුදල් ගෙවීමට කැමති නිලධාරීන් පහත සඳහන් පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව මෙයින් දන්වමි.

1. තමාගෙන් අයවිය යුතු මුදල සම්පූර්ණයෙන්ම එකවර ගෙවා නිම කිරීමට හැකියාව ඇති නිලධාරින් විසින් එම මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කිරීම.

2. ගෙවීමට ඇති සම්පුර්ණ මුදලින් හරි අඩකට නොවැඩි මුදලක් විශ්‍රාම පාරිතෝෂිකයෙන් ගෙවීමට හා ඉතිරි මුදල වෛකල්පික විශ්‍රාම ගැන්වීමේ දිනට පෙර උපරිම වාරික 120 කින් ගෙවා නිම කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

3. තමා විශ්‍රාම ගන්නා වයසට ආසන්න වී ඇති නිලධාරින් දැනට ක්‍රියාත්මක ක්‍රමවේදය අනුව තමාගෙන් අයවිය යුතු සම්පූර්ණ මුදල විශ්‍රාම පාරිතෝෂිකයෙන් හා විශ්‍රාම පාරිතෝෂිකය ප්‍රමාණවත් නොවන්නේ නම් තමාගේ පෞද්ගලික මුදලින් ගෙවා විශ්‍රාම වැටුප සකස් කර ගැනීමට කටයුතු කිරීම.

මේ අනුව ඉදිරි පියවර ගන්නා මෙන් කාරුණිකව දන්වමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

| | | | |
|---|---|---|---|
| 1. | අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය | - | කා.දැ.ගැ.ස. |
| 2. | ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව | - | කා.දැ.ගැ.ස. |
| 3. | ලේකම්, මුදල් අමාත්‍යාංශය | - | කා.දැ.ගැ.ස. |
| 4. | ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - | කා.දැ.ගැ.ස. |
| 5. | ලේකම්, සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මුල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | - | කා.දැ.ගැ.ස. |
| 6. | ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව | - | කා.දැ.ගැ.ස. |
| 7. | විගණකාධිපති | - | කා.දැ.ගැ.ස. |
| 8. | අධ්‍යක්ෂ ජනරාල්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | - | කා.දැ.ගැ.ස. |
| 9. | ආයතන අධ්‍යක්ෂ ජනරාල් | - | කා.දැ.ගැ.ස. |
| 10. | කම්කරු කොමසාරිස් ජනරාල්, කම්කරු දෙපාර්තමේන්තුව | - | කා.දැ.ගැ.ස. |
| 11. | සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් | - | කා.දැ.ගැ.ස. |
| 12. | ප්‍රධාන ගණකාධිකාරි, ප්‍රධාන කාර්යාලය | - | දැ.ගැ.ස. හා අ.ක.ස. |
| 13. | ප්‍රධාන අභ්‍යන්තර විගණක, ප්‍රධාන කාර්යාලය | - | දැ.ගැ.ස. |
| 14. | සියළුම අංශ ප්‍රධානීන්, ප්‍රධාන කාර්යාලය | - | දැ.ගැ.ස. |
| 15. | සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් | - | ගෙවිය යුතු මුදල ගණනය කර දීම සඳහා. |
| 16. | සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් | - | දැ.ගැ.ස. |

**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වන නිලධාරීන් වෙත බලපා ඇති පරිපාලන ගැටළු විසඳීම**